සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
පස්වැනි කලාපය, ද්විතීය භාගය, 2010 ජනවාරි , 293-309
ISSN 1800-1459

# ශිලාලේඛනාගත මූලික වාක්‍යාකෘතික ස්වරූප පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (ක්‍රි. පූ. 03 - ක්‍රි. ව. 07 අවසන තෙක් සෙල්ලිපි ඇසුරිනි)

**මිනුවන්ගමුවේ මහානාම හිමි**

*සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණි විශ්වවිද්‍යාලය, පේරාදෙණිය*

**සාරාංශය**

සිංහල භාෂාවේ ආරම්භය පිළිබඳ විද්‍යමාන ආදි ම සාධක වන සෙල්ලිපි මුල් ම අවධියෙහි ප්‍රමාණයෙන් ඉතා කෙටි විය. ක්‍රියා පද සහිත වාක්‍ය හා ක්‍රියා පද රහිත සරල වාක්‍ය ස්වරූපයක් ගත් එම ලේඛන කාලාතික්‍රමයෙන් දීර්ඝ මෙන් ම ක්‍රමයෙන් සංකීර්ණ ස්වරූපයට ද පත් විය. එම ලක්ෂණ ක්‍රි.පූ. 3 වන සියවසයේ සිට ක්‍රි.ව. 07 වන සියවස තෙක් සෙල්ලිපි ඇසුරින් සනිදර්ශන ව විමසීම මේ යටතේ සිදු කර ඇත. මෙකී කාල පරාසය තුළ ශිලා ලේඛනවල වක්‍යාකෘති විමර්ශනයේ දී ක්‍රියා පද සහිත බව, රහිත බව, නාම වාක්‍යාංශ, ක්‍රියා වාක්‍යාංශ ආදී ලක්ෂණ පිළිබඳ අවධානය යොමු කර ඇත. වර්තමාන සිංහල භාෂා ව්‍යවහාරයේ ආදිතම චර්යා හා සංකීර්ණතා පිළිබඳ පුරෝගාමී ඥානයක් පාඨනය කිරීම පත්‍රිකාවේ අරමුණු අතර ඇත. ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අභිලේඛන පර්යේෂකයන්ගේ ප්‍රකාශිත ශිලාලේඛන සංග්‍රහයන් මේ පර්යේෂණයට පාදක වී ඇත.

**කේන්ද්‍රිය වචන:** සෙල්ලිපි, වාක්‍යාකෘති, ක්‍රියාව, වාක්‍යාංශය, නාම වාක්‍යාංශය

## හැඳින්වීම

ශ්‍රී ලාංකේය සංස්කෘතියෙහි සුවිශේෂී අවස්ථාවක් වශයෙන් ක්‍රි.පූ. 3 වන සියවසේ සිදු වූ මහින්දාගමනය සඳහන් කිරීම සහේතුක ය. මහින්දාගමනය සිංහල භාෂා ශාස්ත්‍රාදියෙහි ක්‍රමික සංවර්ධනය විෂයෙහි මහත් පිටිවහලක් සැපයී ය. සිංහල භාෂාවේ ආරම්භය ක්‍රි.පූ. 3 වන සියවස හෝ ඊටත් පූර්ව යුගයට හෝ අයත් සේ සැලකිය හැකි ය. සිංහල භාෂාවේ ලේඛන ව්‍යවහාරය පිළිබඳ විද්‍යමාන සාධක හමුවන්නේ මහින්දාගමනයත් සමඟ ය. ක්‍රි.පූ. 3 වන සියවසයේ සිදු වූ මහින්දාගමනයත් සමඟ ම ලෙන් පූජා කිරීමාදී කරුණු මූලික කර ගනිමින් රචිත සෙල්ලිපි කාලාත්‍රික්‍රමණයෙන් වඩාත් සවිස්තරාත්මක මෙන් ම දීර්ඝ වන්නට විය. සිංහල භාෂාවේ ආරම්භය මතු නොව එහි ව්‍යාකරණය පිළිබඳ විද්‍යමාන ආදිතම ලිඛිත සාධක වන්නේ ද එම ලේඛන යි. එම ලේඛන සංඛ්‍යාත්මක ව මෙතෙකැයි ප්‍රමාණ කළ නොහැකි ය. එහෙයින්, ක්‍රි.පූ. 3 වන ශතවර්ෂාරම්භයේ සිට ක්‍රි.ව. 7 වන ශතවර්ෂාවසානය තෙක් සෙල්ලිපි කෙරෙහි පමණක් අවධානය යොමු කරමින් එම අවධියේ ශිලාලේඛනයන්හි භාවිත කරැති මූලික වාක්‍යාකෘතික ස්වරූප පිළිබඳ මෙහි දී විමසා බැලේ. මෙහි පාදක සටහන් සඳහා ශාස්ත්‍රීය ක්‍රමයක් උපයෝගී කර ගැනීමේ දී ප්‍රායෝගික දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදු විය.

මුල් කාලීන වාක්‍ය ප්‍රමාණාත්මක ව ඉතා කෙටි විය. බොහෝ විට ක්‍රි.පූ. 3 වන සියවසේ සිට ක්‍රි.ව. 1 වන සියවස පමණ වන තුරු අපට හමුවන ශිලා ලේඛන කෙටි එක් වාක්‍යයකට හෝ දෙකකට පමණක් සීමා වෙයි. මෙම යුගයේ ලේඛයන් ඉතා සංක්ෂිප්ත වීම කෙරෙහි කරුණු කිහිපයක් බලපෑවේ ය. ඒ අතර:

1. ලේඛනමය දුෂ්කරතාව
2. පළ කළ අදහස් ඉතා සංක්ෂිප්ත ව දැක්වීම
3. ලේඛනමය උපකරණයන්හි නොදියුණු බව
4. සියලු ම ලේඛනයන් පාහේ ලෙන් ආදි පූජා කිරීම පිළිබඳ ලියා තැබීම වැනි එක ම විෂයකට සීමා වීම

යන කරුණු මූලික වශයෙන් දැක්විය හැකි ය.

එසේ වුව ද ක්‍රමික විකාශනයත් සමඟ එම යුගයේ ශිලා ලේඛනයන් ද ක්‍රමයෙන් සංවර්ධනය වූ බව පෙනේ. මුල් අවධියෙහි ප්‍රකාශිත සීමිත අදහස්වලට වඩා වැඩි යමක් ලේඛනගත කිරීමට පෙළඹීම මෙන් ම ලේඛනමය උපකරණයන් ක්‍රමයෙන් දියුණු වීම වැනි හේතුන් මත තත් යුගයේ ශිලා ලේඛනයන් ක්‍රමයෙන් දීර්ඝ වන්නට විය. එහෙයින් යථෝක්ත අවධියේ ක්‍රමික වර්ධනයත් සමඟ ඇති වූ ශිලා ලේඛනයන් ද මුල් අවධියෙහි පැවති සරල, ඒකාකාරී ස්වරූපයෙන් මිදී ක්‍රමයෙන් සංකීර්ණ වන්නට විය.

ක්‍රි.පූ. 3 වන සියවසේ සිට ක්‍රි.ව. 7 වන සියවස තෙක් වාක්‍ය ආකෘතිය අනුව මූලික වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකි ය.

1. ක්‍රියා පද සහිත වාක්‍ය
2. ක්‍රියා පද රහිත වාක්‍ය යනුවෙනි.

කිසියම් අවසන් ක්‍රියාර්ථයක් ප්‍රකාශ කරන්නා වූ ක්‍රියාවක් සහිත වාක්‍ය ක්‍රියා පද සහිත වාක්‍ය වශයෙන් හැඳින්විය හැකි ය. ක්‍රි.පූ. 3 වන සියවසේ සිට ක්‍රි.ව. 7 වන සියවස තෙක් ශිලා ලේඛනයන්හි කිසියම් අවසාන ක්‍රියාර්ථයක් ප්‍රකාශ කරන ක්‍රියා පදයක් සහිත වාක්‍ය සාපේක්ෂ ව ගත් කල සීමිත ය.

නිද :"ගපති චුදුතර පුත ගුතශ ලෙණෙ ශගශ දිනෙ"(I. C. Vol. i, 1970: 64).

"මහරජ වහයහ රජෙහි අමෙතෙ ඉසිගිරයෙ නකදිව බුජමෙනි බදකර අතනෙහි පියගුක තිස විහර කරිතෙ" (E.Z. Vol. iv 1943: 237).

මෙම වාක්‍යයන් දෙකෙහි ම කිසියම් අවසාන ක්‍රියාර්ථයක් දෙන ක්‍රියා පද දෙකක් වෙයි. එය වාක්‍යයේ ප්‍රධානත්වය දරන නාමය හා ඍජු ව බැඳී පවතී. ක්‍රි.පූ. 3 වන සියවසේ සිට ක්‍රි.ව. 7 වන සියවස තෙක් ක්‍රියා පද සහිත වාක්‍ය මූලික වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකි ය. එනම්;

1. අවසන් ක්‍රියා සහිත සම්පූර්ණ වාක්‍ය
2. ක්‍රියා වාක්‍යාංශ වශයෙනි.

මූලික වශයෙන් නාම වාක්‍යාංශයකින් සහ අවසන් ක්‍රියා වචනයක් සහිත ක්‍රියා වාක්‍යාංශයකින් සමන්විත වාක්‍ය අවසන් ක්‍රියා සහිත සම්පූර්ණ වාක්‍ය වශයෙන් හැඳින්විය හැකි ය. ඉහත දක්වා ඇති වාක්‍ය ම මේ සඳහා නිදසුන් කළ හැකි ය.

ඇතැම් අවස්ථාවන්හි ක්‍රියා පද සහිත වාක්‍යයක ක්‍රියා වාක්‍යාංශය පමණක් ද හමු වේ.

නිද : "සගයෙ නියතෙ" (I. C. Vol. i, 1970: 98)

මෙහි නිශ්චිත ක්‍රියාර්ථයක් සහිත අවසන් ක්‍රියාවක් වෙයි. එහෙත්, ඒ හා බැඳුණු සෘජු උක්තයක් හමු නො වේ.

ක්‍රි.පූ. 3 වන සියවසේ සිට ක්‍රි.ව. 7 වන සියවස තෙක් හමුවන දෙවන වාක්‍ය විශේෂය වශයෙන් ක්‍රියා පද රහිත වාක්‍ය දැක්විය හැකි ය. මේ කාලයට අයත් ශිලා ලේඛනයන් අතර අතිබහුතරයක් මෙම ගණයට අයත් වේ.

නිද : "උපසික තිසය ශගශ" (I. C. Vol. i, 1970: 98)

ක්‍රි.පූ. 3 වන සියවසේ සිට ක්‍රි.ව. 7 වන සියවස තෙක් බහුල ව හමු වන මෙවැනි වාක්‍යයන්හි ප්‍රධාන ක්‍රියාර්ථය දරන අවසන් ක්‍රියාවක් හමු නොවේ. එහෙයින්, මෙවැනි ක්‍රියා රහිත වාක්‍ය ක්‍රියා පද රහිත වාක්‍ය සේ දක්වමු.

ක්‍රියා පද රහිත වාක්‍යයන් ද මූලික වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකි ය.

1. ක්‍රියාව පමණක් රහිත වාක්‍ය
2. නාම වාක්‍යාශය පමණක් සහිත වාක්‍ය යනුවෙනි.

ක්‍රියාව පමණක් රහිත වක්‍ය යනු නාම වාක්‍යාංශයක් සහ ක්‍රියාවක් රහිත ක්‍රියා වාක්‍යංශයක් වාක්‍ය යි. එහෙත්, අදාළ සෙල්ලිපි පාඨයෙන් කියවෙන අදහස නිරවුල් ව අවබෝධ කර ගැනීමට එය බාධාවක් නොවේ.

නිද : "පරුමක මිත ඣය පරුමක ශත නශත ඣිත පරුමකලු පුශය ලෙණෙ / අගත අනගත චතුදිශ ශගශ" (I. C. Vol.1, 1970: 10).

මෙම වාක්‍යයෙහි ආරම්භයේ සිට 'ලෙණෙ' දක්වා කොටස නාම වාක්‍යාංශය යි. අනෙක් කොටස ක්‍රියා වාක්‍යාංශය යි. එහෙත්, එහි ක්‍රියාවක් නොමැති හෙයින් සම්පූර්ණ ක්‍රියා වාක්‍යාංශය වශයෙන් නොව, ක්‍රියා වාක්‍යාංශයෙන් කොටසක් සහිත

වාක්‍යාංශයක් වශයෙන් සැලකීම වඩා යෝග්‍ය ය. මෙවැනි වාක්‍යයන්, වාක්‍යයෙහි සමස්ත බර දරන්නා වූ ක්‍රියා පදයක් රහිත හෙයින් ක්‍රියාව පමණක් රහිත වාක්‍ය වශයෙන් දක්වමු.

ක්‍රියා වාක්‍යාංශය රහිත, නාම වාක්‍යාංශයකින් පමණක් සමන්විත වාක්‍ය ක්‍රියා පද රහිත වාක්‍යයන්හි දෙවන කොටසට අයත් වේ. උක්ත සමයට අයත් ශිලා ලේඛයන් අතර විශාල ප්‍රමාණයක් ක්‍රියා පද රහිත වාක්‍ය යි. එම වාක්‍ය අතරින් ද නාම වාක්‍යාංශය පමණක් සහිත වාක්‍ය ක්‍රියාව පමණක් රහිත වාක්‍යයන්ට සාපේක්ෂ ව සංඛ්‍යාත්මක ව බලන කල අධික ය.

නිද : "දතියශ ලෙණෙ" (I. C. Vol.i, 1970: 18)

"තිශරකිත තෙරශ ලෙණෙ" (I. C. Vol.i, 1970: 18)

මෙම ගණයට අයත් වාක්‍යයන්හි ක්‍රියා වාක්‍යාංශය සම්පූර්ණයෙන් ම ඉවත් වී ඇත. එසේ ම, නිරවුල් අර්ථාවබෝධයට තරමක බාධාවක් ද ඇති කරයි. එහෙත්, අදාළ ශිලා ලිපිය පිහිටි ස්ථානයෙහි සිට කියවන්නෙකුට එහි අර්ථාවබෝධය දුෂ්කර නොවේ.

## අරමුණු

- සිංහල භාෂාවේ වාක්‍යාකෘතික ස්වරූප පිළිබඳ ව විද්වතුන් ඉතා මඳ වශයෙන් පමණක් අවධානය යොමු කොට ඇති හෙයින් ඒ පිළිබඳ ව යම් පමණකට හෝ අවධානය යොමු කිරීම
- සෙනරත් පරණවිතානයන්ගේ 'ලක්දිව සෙල්ලිපි'; ආදි බ්‍රාහ්මී අභිලේඛන සංහිතා' වැනි ඉංග්‍රීසි භාෂාවෙන් රචිත ග්‍රන්ථයන්හි මෙම විෂයට අදාළ ව තරමක් දුරට කරුණු සාකච්ඡා කර ඇතිමුත් සිංහලයෙන් රචිත ශාස්ත්‍රීය ලිපි ලේඛන අතිශය දුලබ වීම
- ක්‍රි.පූ. 3 වන සියවසේ සිට ක්‍රි.ව. 7 වන සියවස තෙක් ශිලා ලේඛනාගත වාක්‍යාකෘතික ස්වරූපය කෙබඳු වී ද? මූලික වාක්‍යාකෘති කෙසේ විකාසයට පත් වීද? එහි දී ඒ සඳහා එක් වූ කොටස් මොනවා ද? එසේ එක් වූ කොටස් වාක්‍යයන්හි කෙසේ භාවිත කර ඇත්තේ ද? යන්න පිළිබඳ විමර්ශනය කිරීම

## ක්‍රමවේදය

මෙහිදී අප විසින් අවධානය යොමුකරනු ලැබූයේ ක්‍රි.පූ. 3 වන සියවසේ සිට ක්‍රි.ව. 7 වන සියවස තෙක් ශිලා ලේඛන කෙරෙහි පමණි. එම අවධියට අයත් ශිලා ලේඛනයන් වාක්‍යාකෘති අනුව වර්ගීකරණය කරනු ලැබේ. එහි දී වාක්‍යාකෘති අනුව සාම්‍යතාවක් දක්වන ශිලා ලිපි සාම්‍යතාව අනුව වෙන් කොට, ඒ සඳහා නිදසුන් වශයෙන් ඉන් එකක් හෝ දෙකක් දක්වා ඇත. ආකෘති අනුව විෂමතාවෙන් යුත් වාක්‍ය වෙන වෙන ම විමසා සනිදර්ශන ව කරුණු සාකච්ඡා කෙරේ.

## ක්‍රි.පූ. 3 වන සියවසේ සිට ක්‍රි.ව. 7 වන සියවස තෙක් ශිලාලේඛනාගත මූලික වාක්‍යාකෘතික ස්වරූප

මූලික වාක්‍යාකෘතික ස්වරූප යන්නෙන් අදහස් වන්නේ ක්‍රි.පූ. 3 වන සියවසේ සිට ක්‍රි.ව. 7 වන සියවස තෙක් වාක්‍ය නිර්මාණය කිරීමෙහිලා උපයුක්ත මූලික ආකෘතික ස්වරූපයෝ ය. මේ සඳහා පහත වර්ගීකරණය උපයෝගි කර ගැනේ.

1. ක්‍රියා පද සහිත වාක්‍යයන්හි මූලික වාක්‍යාකෘතික ස්වරූප
2. ක්‍රියා පද රහිත වාක්‍යයන්හි මූලික වාක්‍යාකෘතික ස්වරූප

මෙම අනුශීර්ෂයන් යටතේ කෙරෙන ඉදිරි සාකච්ඡාවන්හි උපයෝගී කර ගනු ලබන වචන කිහිපයක් පිළිබඳ පළමු ව සඳහන් කළ යුතු ය.

1. ප්‍රධාන නාමය : ප්‍රධාන නාමය හෙවත් නාම පදය වශයෙන් අදහස් කෙරෙනුයේ නාම වාක්‍යාංශයෙහි ප්‍රධාන නාමය වශයෙන් යෙදෙන්නා වූ ද සමස්ත වාක්‍යයෙහි ක්‍රියාව හා ඍජු ව බද්ධ වන්නා වූ ද නාම පදය යි.

2. අප්‍රධාන නාමය : ක්‍රියා වාක්‍යංශයට අයත්, ක්‍රියාවේ ඵලය ලබන්නා හඟවන්නා වූ නාම පදය අප්‍රධාන නාමය වශයෙන් මෙහි දී භාවිත කෙරේ.

3. ක්‍රියාව : සමස්ත වාක්‍යයෙහි අවසාන ක්‍රියාර්ථය හඟවනු වස් උපකාරී වන අවසාන ක්‍රියාව මෙහි දී ක්‍රියාව වශයෙන් සලකනු ලැබේ.

### ක්‍රියා පද සහිත වාක්‍යයන්හි මූලික වාක්‍යාකෘතික ස්වරූප

ක්‍රි.පූ. 3 වන සියවසේ සිට ක්‍රි.ව. 7 වන සියවස තෙක් ශිලාලේඛනාගත ක්‍රියා පද සහිත වාක්‍ය මූලික වශයෙන් නාම වාක්‍යාංශයකින් හා ක්‍රියා වාක්‍යාංශයකින් සමන්විත වේ. ක්‍රියා පද සහිත වාක්‍යයන්හි නාම වාක්‍යාංශය යන්නෙන් අදහස් කෙරෙන්නේ නාම වාක්‍යාංශයේ ප්‍රධානත්වය දරන්නා වූ ද, සමස්ත වාක්‍යයෙහි ක්‍රියා පදය හා සම්බන්ධ වන්නා වූ ද නාම පදය සහිත වාක්‍යාංශය යි. අවසන් ක්‍රියාර්ථයක් දෙන ක්‍රියාවක් සහිත වාක්‍යාංශය ක්‍රියා පද සහිත වාක්‍යයන්හි ක්‍රියා වාක්‍යාංශය යන්නෙන් අදහස් වේ. සරල වාක්‍යයක් නාම වාක්‍යාංශයකින් මෙන් ම ක්‍රියා වාක්‍යාංශයකින් ද සමන්විත ය.

නිදා: "බදත බමණ තිශහ ලෙණෙ / චතුදිශ ශගශ දිනෙ"
නාම වාක්‍යාංශය ක්‍රියා වාක්‍යාංශය (I. C. Vol. i, 1970: 18)

(i) මෙම මූලික කොටස් දෙක විවිධාකාරයෙන් විස්තාරණය වීම මත බිහි වූ වාක්‍යාකෘති පිළිබඳ ව විමසීම ක්‍රියා පද සහිත වාක්‍යයන්හි මූලිකාකෘතික ස්වරූප යන්නෙන් අදහස් කරමු. එම ආකෘතික ස්වරූප පහත ආකාරයට දැක්විය හැකි ය.

සිංහල බ්‍රාහ්මී යුගයේ ක්‍රියා පද සහිත වාක්‍යයන්හි මූලික ආකෘතිය මෙසේ ය.

නාම විශේෂණ + ප්‍රධාන නාමය / අප්‍රධාන නාමය + ක්‍රියාව

නිද : "බත පුණශ ලෙණෙ / ශගයෙ දිනෙ"
නා. වි. + ප්‍ර. නා. / අප්‍ර. නා. + ක්‍රියාව (I. C. Vol. i, 1970: 31)

(ii) නාම වාක්‍යාංශයේ නාමය හා සම්බන්ධ වන නාම විශේෂ දෙකක් හෝ වැඩි ගණනක් යෙදීමෙන් වාක්‍යයෙහි නාම වාක්‍යාංශය අවශ්‍ය ප්‍රමාණයට දීර්ඝ කළ හැකි ය. එවැනි වාක්‍යයන් ද ඉතා සරල ක්‍රියා වාක්‍යාංශයකින් යුක්ත වේ.
එවැනි වාක්‍යයන්හි ආකෘතිය පහත පරිදි වේ.

1. නා. වි. + නා. වි. + ප්‍ර. නා. / අප්‍ර. නා. + ක්‍රි.
නිද : "බත ශුමනශ ලෙණ / ශගශ දිනෙ" (I. C. Vol. i, 1970: 28)

2. නා. වි. + නා. වි. + නා. වි. +ප්‍ර. නා. /අප්‍ර. නා. + ක්‍රි
නිද : " පුතපිතහ තිසරකිතහ ලෙණ / ශගශ දිනෙ"(I. C. Vol. i, 1970: 32)

3. නා. වි. + නා. වි. +නා. වි. + නා. වි. + ප්‍ර. නා. /අප්‍ර. නා. + ක්‍රි.
නිද : "ගපති යශොපල පුත ශොණශ ලෙණ / ශගශ දිනෙ"
(I.C. Vol. i,1970: 46)

මේ අයුරින් නාම වාක්‍යාංශයේ නාමයට තව තවත් විශේෂණ පද එක් කිරීමෙන් නාම වාක්‍යාංශය දීර්ඝ කළ හැකි ය.

(iii) තව ද, ප්‍රධාන නාමයට විශේෂණ වශයෙන් නාම විශේෂණ වාක්‍ය ඛණ්ඩ එකක් හෝ කිහිපයක් හෝ යෙදීමෙන් ද වාක්‍ය දීර්ඝ වේ. එවැනි නාම වාක්‍යාංශ සහිත වාක්‍යයක් ද සරල ක්‍රියා වාක්‍යාංශයකින් යුක්ත වේ. එවැනි වාක්‍යයන්හි ආකෘතිය පහත පරිදි වේ.

1. නා. වි. වා. ඛ. + ප්‍ර. නා. / අප්‍ර. නා. + ක්‍රි
නිද : "ගමික කඩක කුලශ ලෙණෙ / ශගශ නියතෙ"
(I. C. Vol. i, 1970: 59)

2. නා. වි. වා. ඛ. + නා. වි. වා. ඛ. + ප්‍ර. නා. / අප්‍ර. නා. + ක්‍රි
නිද : "පරුමක මඣිම පුතශ, පරුමක ශොණශ ලෙණෙ / ශගශ දි
(I. C. Vol. i, 1970: 39)

මෙම ආකෘතියට ම නාම විශේෂණ වාක්‍යාංශ එක් වී නාම වාක්‍යාංශය දීර්ඝ වේ.

(iv) නාම වාක්‍යාංශයෙහි නාමය හා බැඳෙන නාම විශේෂණ හෝ නාමවිශේෂණ වාක්‍ය ඛණ්ඩ ප්‍රධාන නාමයට මුලින් යෙදීම ක්‍රි.පූ. 3 වන සියවසේ සිට ක්‍රි.ව. 7 වන සියවස තෙක් සාමාන්‍ය ලක්ෂණය යි. එවැනි වාක්‍යයක ආකෘතිය ඉහත දැක්වූ ආකෘතීන්ට සමාන ය.

නා. වි. + නා. වි. + නා. වි. + ප්‍ර. නා. / අප්‍ර. නා. + ක්‍රි
නිද : " ගමික කඩක කුලශ ලෙණෙ / ශගශ නියතෙ,
(I. C. Vol. i, 1970: 59)

(v) ඇතැම් අවස්ථාවන්හි නාම වාක්‍යාංශයේ නාමයට පරව ද නාම විශේෂණ යෙදේ.

නිද : "පරුමක නදික පුතශ, පරුමක මිතශ ලෙණෙ මහශුදශනෙ / ශගශ දිනෙ"(I. C. Vol. i, 1970: 26)

නා. වි. වා. ඛ. + නා. වි. වා. ඛ. + ප්‍ර. නා. + නා. වි. / අප්‍ර. නා. + ක්‍රි
මෙම වාක්‍යයෙහි ආකෘති එක් අවස්ථාවක දී පමණක් වෙනස් වී ඇත. නාම වාක්‍යාංශයේ නාමයට පර ව නාම විශේෂණ යෙදීම හැර අනෙක් සියලු වාක්‍ය ආකෘති පෙර වාක්‍යාකෘතීන්ට සමාන ය.

(vi) ඇතැම් අවස්ථාවන්හි නාම වාක්‍යාංශයේ නාමය හා සම්බන්ධ වන නාම විශේෂණ ක්‍රියා වාක්‍යාංශයෙන් පසුව ද යෙදේ.

නිද : "සිධ විහර මවිත පරිහ චත ගොවක සිවහ ලෙණෙ / චතුදිසික සගයෙ නියතෙ / නක රජහ රජහි මවිතෙ" (I. C. Vol. i, 1970: 80)

මෙහි මූලික වාක්‍යාකෘතිය පහත පරිදි වේ.

නා. වා. + ක්‍රි. වා. + නා. වි.

(vii) නාම වාක්‍යාංශයේ නාමය හා බැඳෙන නාම විශේෂණ කිහිපයක් යෙදෙන අවස්ථාවන්හි ඒවා 'ච' නිපාතයෙන් සම්බන්ධ කර ඇත.

නිද : "උපශක ඉදගුශශ ච උපශික දතය ච ලෙණෙ / ශගශ නියතෙ"
(I.C. Vol. i, 1970: 42)
මෙම වාක්‍යයෙහි ආකෘතිය පහත පරිදි වේ.

නා. වි. + නි. + නා. වි. + නි + ප්‍ර. නා. / අප්‍ර. නා. + ක්‍රි

මෙවැනි නාම වාක්‍යාංශයන්ට නාම විශේෂණ හෝ නාම විශේෂණ වාක්‍ය ඛණ්ඩ එක් කිරීමෙන් එය විස්තාරණය කළ හැකි ය.

(viii) ක්‍රියා වාක්‍යාංශයට අයත් ක්‍රියාවේ ඵලය භාගවන නාමය හෙවත් අප්‍රධාන නාමය හා සම්බන්ධ වන නාම විශේෂණ සංඛ්‍යාත්මක ව වර්ධනය කිරීමෙන් ක්‍රියා වාක්‍යාංශය දීර්ඝ වේ. නාම වාක්‍යාංශයෙහි මෙන් ම ක්‍රියා වාක්‍යාංශයේ අප්‍රධාන නාමයට විශේෂණ නාමයන් එකක්, දෙකක් හෝ ඊට වැඩි ගණනක් එකතු වීම මෙහි ලක්‍ෂණයකි. මෙවැනි වාක්‍යයක සාමාන්‍ය ආකෘතිය මෙසේ ය.

නිද : "ගපතිශිවහ ලෙණෙ /චතුදිශික ශගශ දිනෙ" (I. C. Vol. i, 1970: 40)

2. නා. වි. + නා. වි. + නා. වි. + ප්‍ර. නා. + අප්‍ර. නා. + ක්‍රි

නිද : "දෙවපුත ගමික ශොණහ ලෙණෙ / අගත අනගත ශගශ දිනෙ" (I. C. Vol. i, 1970: 25)

3. නා. වි. වා. ඛ + ප්‍ර. නා. / නා. වි. + නා. වි. + නා. වි. + අප්‍ර. නා. + ක්‍රි
නිද : "පරුමක නග පුතහ පරුමක මහතෙරහ ලෙණෙ
අගත අනගත චතුදිශ ශගශ දිනෙ" (I. C. Vol. i, 1970: 21)

මෙසේ ක්‍රියා වාක්‍යාංශයෙහි නාමයට නාම විශේෂණය එක් කිරීමෙන් එම වාක්‍යාංශය අභිමතය පරිදි දීර්ඝ කර ගත හැකි ය.

(ix) ක්‍රියා වාක්‍යාංශයේ නාමය හා සම්බන්ධ වන නාම විශේෂණ එම නාමයට පෙරටුව යෙදීම සාමාන්‍ය සිරිත යි. එහෙත්, ඇතැම් තැනක ක්‍රියාවට පසුව ද භාවිත වී අත. එවැනි වාක්‍යාකෘතිය පහත පරිදි වේ.

නා.වා.+ ක්‍රි වා. + නා. වි. වා. ඛ.

නිද : "ගපති තොපශ ශුමන කුලශ ලෙණෙ / ශගශ දිනෙ/අගත අනගත චතුදිශ ශගශ ණී පශු විහරයෙ" (I.C. Vol. i., 1970: 29)

(x) ක්‍රියා වක්‍යාංශයට ක්‍රියා විශේෂණ වශයෙන් හෝ ක්‍රියා විශේෂණ වාක්‍ය ඛණ්ඩ වශයෙන් හෝ කොටස් එක් වූ අවස්ථා ඉතා සීමිත ය.

නිද : "බත ශුමනහ ලෙණෙ / බතික් සලහ දිනෙ ශගශ" (I.C. Vol. i., 1970: 79)

මෙම වක්‍යයෙහි ක්‍රියා විශේෂණය යෙදී ඇත්තේ ක්‍රියාවට පූර්වයෙන් ය. මෙහි වාක්‍යාකෘතිය පහත පරිදි දැක්විය හැකි ය.

නා. වා. / ක්‍රි. වි' + ක්‍රි+ අප්‍ර. නා.

මෙසේ ක්‍රියා වාක්‍යාංශයේ ක්‍රියාවට පූර්වයෙන් ක්‍රියා විශේෂණ එක් වීම මෙම අවධියේ සාමාන්‍ය භාෂා ස්වරූපය විය. එහෙත්, ඇතැම් අවස්ථාවන්හි ක්‍රියා විශේෂණය ක්‍රියාවට පසුව ද යෙදී ඇත. එවැනි වාක්‍යයක නාම වාක්‍යාංශයෙහි ආකෘතිකමය වෙනසක් නැත. නාම වාක්‍යාංශයෙහි නාම විශේෂණ, නාම විශේෂණ වාක්‍ය ඛණ්ඩ කැමති පරිදි අඩු වැඩි විය හැකි ය. ක්‍රියා වාක්‍යාංශයේ ආකෘතිය පමණක් වෙනස් වේ. එවැනි වාක්‍යයක සරල ආකෘතිය වන්නේ :

නා. වා. / අප්‍ර. නා' + ක්‍රි + ක්‍රි. වි + ක්‍රි. වි. වා. ඛ.

නිද : "ගමණි උති මහරඣහ ඣිතබි තිශය ලෙණෙ/ දශ දිගශ සගයෙ දිනෙ / මත පිතශ අටයෙ" (I.C. Vol. i., 1970: 3)

මෙම වාක්‍යයෙහි 'දිනෙ' යන ක්‍රියාවට විශේෂණ වනනේ 'මත පිතශ අටයෙ' යන්න යි. එය ක්‍රියා වාක්‍යාංශයේ ක්‍රියාවට පර ව යෙදී ඇති බව පැහැදිලි ය.

(xi.) නාම වාක්‍යාංශය හා ක්‍රියා වාක්‍යාංශ සංයෝග වීමේ සරල මෙන් ම මූලික ම ක්‍රමය වන්නේ නාම වක්‍යාංශය පළමු ව යෙදීම හා ක්‍රියා වක්‍යාංශය පසුව යෙදිම යි. එවැනි වාක්‍යයක මූලික ආකෘතිය පහත පරිදි වර්ග කළ හැකි ය.

නා.වා. + ක්‍රි වා.

නිද : "පරුමක නග පුත පරුමක පිගලගුතස ලෙණෙ / අගත අනගත චතු දිස සඝස දිනෙ" (I.C. Vol. i., 1970: 29)

ඇතැම් අවස්ථාවන්හි ක්‍රියා වාක්‍යාංශය පළමු ව ද " නාම වාක්‍යාංශය දෙවනු ව ද යෙදුණු අවස්ථා හමු වේ. මෙවැනි වාක්‍යයන් අතිශය සීමිත ය. එබඳු වාක්‍යයක සරල ආකෘතිය වන්නේ :

ක්‍රි වා. + නා. වා. වශයෙන් යෙදීම යි

නිද : "ශගශ දිනෙ / උපශක ශුමනශ ලෙණෙ" ( I.C. Vol. i., 1970: 56)

මෙසේ නාම වාක්‍යාංශයට හා ක්‍රියා වාක්‍යාංශයට නාම විශේෂණ හා ක්‍රියා විශේෂණාදිය එකක් හෝ වැඩි ගණනක් එක් වීමෙන් වාක්‍යයන් වඩාත් විස්තාරණය වෙයි. එහෙත්, එහි මූලික ආකෘතික ලක්ෂණ වන්නේ ඉහත ආකෘතීන් ම ය.

(xii.) ක්‍රියා වාක්‍යාංශය හා සම්බන්ධ වන නාම වාක්‍යාංශ දෙකක් පවතින ඇතැම් අවස්ථාවන්හි වාක්‍ය ආකෘතිය ඉහතාකාරයට වඩා වෙනස් වේ. එවැනි වාක්‍යයක දළ ආකෘතිය පහත ආකාර වේ.

නා. වා.+ ක්‍රි වා. + නා. වා.

නිද : "දමරුචි තෙරශ ලෙණෙ/ වතු දිශ ශගශ දිනෙ ශමතපශදිකෙ නම "(I.C.Vol.i, 1970: 42)

(xii.) කර්ම කාරක වාක්‍ය

ක්‍රියා වචන සහිත කර්ම කාරක වාක්‍යයන්හි ආඛ්‍යාතය බොහෝ විට සමානාධිකාර වෙයි. එසේ ම, බොහෝ වාක්‍යයන්හි අනුක්ත කර්තෘ විද්‍යමාන නොවේ. ඉතා දුර්ලභ වශයෙන් ද අනුක්ත කර්තෘ සහිත වාක්‍යයන් ද දක්නට ලැබේ.

නිද : "පරුමක ශුමන පුත පරුමක තිශහ ලෙණෙ / මහශුදනෙ නම / අගත අනගත ශගශ පදිටිතෙ " (I.C. Vol. i., 1970: 53)

මෙහි 'ලෙණෙ' යන උක්තයට සමානාධිකරණ වශයෙන් 'පදිටිතෙ' යන අතීත කෘදන්ත රූපය යෙදී ඇත. මෙවැනි වාක්‍යයන්හි ආකෘති ද පෙර දැක් වූ ආකෘතීන්ට ම සමාන ය.

ඇතැම් කර්ම කාරක වාක්‍යයන්හි අනුක්ත කර්තෘ යෙදී ඇත.

නිද : "පුශගුත ථෙරෙන බරවීතෙ ලෙණෙ / ධශදිසතො ශගස පරිබොගයෙ ධිනෙ" (I.C.Vol. i, 1970: 54)

මෙහි අනුක්ත කර්තෘ, කර්තෘ විභක්තියෙන් යෙදී ඇත. උක්ත කර්මය ප්‍රථමා විභක්ති ඒක වචනයෙන් යෙදී ඇති අතර, තදනුරූප ව කර්මකාරක ආඛ්‍යාතය ද ප්‍රථම පුරුෂ ඒක වචනයෙන් යොදා ඇත.

(xiv.) කර්තෘ කාරක වාක්‍ය

ක්‍රියා පද සහිත කර්ම කාරක වාක්‍යයන්හි මෙන් ම කර්තෘ කාරක වාක්‍යයන්හි ද සාමාන්‍ය සම්මත ස්වරූපය වූයේ උක්ත කර්තෘ ඒක වචනාන්ත වන කල්හි ක්‍රියා වචනය ද ඒක වචන වීම හා උක්තය බහු වචන වන කල්හි ක්‍රියාව ද බහු වචන වීම යි.

නිද : "තවඋතර මහ රජහ පුතෙ / තවබිකු සගහට දිනි" (I.C. Vol. ii, Part -1, 1983: 85)

"තව යමත කහබයහ ච ව (බ) ණ ප ඤරවර යහ ච මතතබ දවයහ ච කර අරබ බොයහ ච තවසස ඤබ ල ච මනිය ඤමනි]මවතක ජන එකවය තව බද දවර කබර බබ කබර දනහ" (E.Z. Vol. v, part- 1, 1955: 147)

මෙම නිදසුන් අනුව ඉහත කරුණු සනාථ වේ. මෙවැනි වාක්‍යයන්හි ආකෘති ද මූලික ආකෘතීන්ට ම සමාන ය.

(xv.) වර්තමාන හා අතීත කෘදන්ත රූප ඒ හා සම්බන්ධ වන නාමයට විශේෂණ වශයෙන් යෙදේ.

නිද : "(සි) කඩහ (ව) පි ගම දක වහනක වසිය නද තෙරෙ සමතවය චතර දොරහි පතගඩ අතඩි " (E.Z. Vol. iii, 1933: 215)

"ගමික නග පුතෙ ගමික තිශ කරපිතෙ ඉම ලෙණ/ සෙනපති ඝුවය ශගශ දිනෙ" (I.C. Vol. i., 1970: 39)

මෙවැනි වාක්‍යයන්හි ආකෘති ද මුලින් දැක් වූ ආකෘතීන් මත ම පදනම් වේ.

(xvi.) උක්ත කාලයට අයත් යුගයේ වර්ධනයත් සමඟ මුල් අවධියේ පැවති වාක්‍ය ක්‍රමයෙන් සංකීර්ණ වන්නට විය. විශේෂයෙන් අවසාන ක්‍රියාවට පෙර යෙදෙන පූර්ව ක්‍රියා ආදිය සහිත වාක්‍ය ඛණ්ඩ එකක් හෝ කිහිපයක් යෙදීමෙන් වාක්‍ය ප්‍රමාණාත්මක දීර්ඝ වන්නට විය.

නිද : "මහ රජ (හවහ) බයහු මණුමරක තිස මහ රජහ පුති මහ රජි ගමණි අබෙය /උපලවිබජකහි වඩමනක වවි පවසහ(සි) කහාවණ දරිය කණවය තුබරබ බූක සගහටය චතරිපවෙණි පරි [බුජනක කොටු දිනි] (I.C. Vol. ii, Part -1, 1983: 92)

ඇතැම් විට පූර්ව ක්‍රියා දෙකක් ද එක සමීපයේ යෙදුණු බව මෙම සෙල්ලිපි පාඨයෙන් පැහැදිලි වේ.

(xvii.) නිපාත යෝජනයෙන් ද ක්‍රියා පද සහිත වාකය සංකීර්ණත්වයට පත් වී ඇත. ඒක කර්තෘක, අවසාන ක්‍රියාවක් සහිත වාක්‍යයක නාම එකක් හෝ වැඩිගණනක් නිපාත මඟින් එකට සම්බන්ධ කර ඇත.

නිද : "සිද්ධම් මහකුමරතස රජ අපය [හ/ බමණග] රිය වහෙර කෙණවි වඩ කොටු දිනක මහගරිය වෙවසර [ෙ] ච වුගරිය වෙවසර [ෙ] ච කබුබෙ වෙවසර [ෙ] ච කටවනක පුලසර වෙ [ෙ] වව [ෙ] වම චතර වෙවසර දකපෙත කඩය බෙජි පෙත / බමණගරිය වහෙරෙ බිකසගහට වර පවයට දිනෙත්වග' (E.Z. Vol. iv, 1943: 123)

ක්‍රි. ව. 6 වන සියවසට අයත් නාගිරිකන්ද ශිලා ලේඛනයෙහි එන ඉහත පාඨයෙහි නාමයන් රාශියක් 'වෙ' නිපාතයෙන් එකට සම්බන්ධ වී අවසාන ක්‍රියාව හා සංයෝග වී ඇත.

මෙසේ වර්තමාන කෘදන්ත අතීත කෘදන්ත, පූර්ව ක්‍රියා, නිපාත ආදිය උපයෝගී කර ගනිමින් අවසාන ක්‍රියාව සහිත වාක්‍ය ප්‍රමාණාත්මක ව දීර්ඝ කළ හැකි ය. සංකීර්ණ කළ හැකි ය. එහෙත් මෙවැනි සංකීර්ණ වාක්‍යයන්හි ආකෘතික රටාව මෙහි පළමු ව දැක් වූ මූලික වාක්‍යාකෘතීන් මත ම පදනම් වන බව ඉහත නිදසුන් අනුව පැහැදිලි වේ.

## ක්‍රියා පද රහිත වාක්‍යයන්හි මූලික වාක්‍යාකෘතික ස්වරූප

ක්‍රි.පූ. 3 වන සියවසේ සිට ක්‍රි.ව. 7 වන සියවස තෙක් වන ශිලා ලේඛන අතිබහුතරයක් ක්‍රියා පද රහිත වාක්‍ය ගණයට අයත් වේ. විශේෂයෙන් ආදි බ්‍රාහ්මී යුගයේ ලිපි මේ අතර ප්‍රධාන වේ. තත් කාලීන ලේඛන බොහෝ අවස්ථාවන්හි ක්‍රියා වාක්‍යාංශයේ නාමය වන අප්‍රධාන නාමයෙන් අවසන් වේ. ක්‍රියා පද රහිත වාකයන්හි ආකෘතික ස්වරූපය බොහෝ සෙයින් ක්‍රියා පද සහිත වාක්‍යන්හි ආකෘතික ලක්‍ෂණ ම දරයි. ක්‍රියා පද සහිත වාක්‍යයන්හි නාම වාක්‍යාංශයට මෙම වාක්‍ය හාත්පසින් ම සමාන ය.

ක්‍රියා පද රහිත වාක්‍යයන්හි ආකෘතික ස්වරූප විමසනු වස් පහත වර්ගීකරණය උපයෝගී කර ගනිමු.

I. ක්‍රියා පද පමණක් රහිත වාක්‍යයන්හි ආකෘතික ස්වරූප
II. නාම වාක්‍යාංශය පමණක් සහිත වාක්‍යයන්හි ආකෘතික ස්වරූප
යන ප්‍රභේද පාදක කර ගනිමු.

## ක්‍රියා පද පමණක් රහිත වාක්‍යයන්හි ආකෘතික ස්වරූප

අප සාකච්ඡාවට බඳුන් වන අවධියෙහි රචනා වී ඇති ශිලා ලේඛනගත ක්‍රියා වචනය පමණක් රහිත වාක්‍යන්හි ආකෘතිය ක්‍රියා පද සහිත ආකෘතියෙන් වෙනස් නොවේ. ක්‍රියා පද පමණක් රහිත වාක්‍ය නාම වාක්‍යාංශයකින් මෙන් ම ක්‍රියාව රහිත ක්‍රියා වාක්‍යාංශයකින් ද සමන්විත ය. එසේ ම, ක්‍රියා පද සහිත වාක්‍යන්හි නාම වාක්‍යාංශය හා ක්‍රියාව රහිත වාක්‍යයන්හි නාම වාක්‍යාංශය ආකෘතික ස්වරූපය අනුව කිසිසේත් වෙනස් නොවේ. ක්‍රියා පද සහිත හා ක්‍රියා පද රහිත වාක්‍යන්හි ආකෘතික ස්වරූපය තුලනය කරන කල්හි තත් වාක්‍යන්හි ආකෘතිකමය විෂමතාවන් විද්‍යමාන වනුයේ වාක්‍යාංශයෙහි පමණි. මෙවැනි වැකියක මූලික ආකෘතිය මෙසේ ය.

නා. වා. + අප්‍ර. නා.

නිද : "තිශමිත තෙරශ ලෙණෙ / ශගශ " (I.C. Vol. i., 1970: 50)

ක්‍රියා පද පමණක් රහිත වාක්‍යයක නාම වාක්‍යාංශය හා ක්‍රියා වාක්‍යාංශය සංයෝග වන ආකාරය අනුව ක්‍රියා වචනය පමණක් රහිත වාක්‍ය මතු දැක්වෙන ආකෘතික ස්වරූපයන්ගෙන් සමන්විත වෙයි.

(i.) නාම වාක්‍යාංශයට පසුව ක්‍රියා වාක්‍යාංශය යෙදීම. මෙහි දී නාමවාක්‍යාංශය නාම විශේෂණ, නාම විශේෂණ ඛණ්ඩ ආදියෙන් සමන්විත වන අතර අභිමතය පරිදි දීර්ඝ හෝ කෙටි කළ හැකි ය. මෙවැනි වාක්‍යයක ආකෘතිය පහත පරිදි වේ.

නා. වා. + ක්‍රි. රහිත ක්‍රි. වා.

නිද : "බත තිශගුතහ ලෙණ/ අගත අගගත චතුදිශ ශගශ "
(I.C. Vol. i., 1970: 36)

මෙම වාක්‍යයෙහි අප්‍රධාන නාමයට නාම විශේෂණ තුනක් භාවිත කර ඇත. මෙසේ ක්‍රියා වචනය රහිත වාක්‍යයන්හි ක්‍රියා වාක්‍යාංශය ද අවශ්‍ය පරිදි නාම විශේෂණ හෝ නාම විශේෂණ වාක්‍ය ඛණ්ඩ භාවිත කිරීමෙන් දීර්ඝ වාක්‍ය නිර්මාණය කළ හැකි ය. එබඳු වාක්‍යාංශ ක්‍රියා පද සහිත ක්‍රියා වාක්‍යාංශයන්හි නාමයට විශේෂණ වශයෙන් එම නාමයට මුලින් එකතු වූ නාම විශේෂණ සහිත ක්‍රියා වාක්‍යාංශයට සමාන ය.

(ii.) නාම වාක්‍යාංශ දෙකක් අන්‍යොන්‍ය වශයෙන් සම්බන්ධ වන ක්‍රියා වාක්‍යාංශය සහිත වාක්‍යයක ක්‍රියා වචනය රහිත වාක්‍යාංශය නාම වාක්‍යාංශයන්ට පූර්වයෙන් යෙදේ. එබඳු වාක්‍යයක ආකෘතික ස්වරූපය මෙසේ ය.

ක්‍රි ර. වා. + නා. වා + නා. වා.

නිද : "සගශ. / බත චිතගුතශ පුත වෙලුශ ලෙණෙ/ පරුමක. මශ ලෙණෙ"
( I.C. Vol. i., 1970: 10)

(iii.) නාම වාක්‍යාංශ ඛණ්ඩ එකක් හෝ කිහිපයක් ක්‍රියා වාක්‍යාංශය හා අන්‍යොන්‍ය වශයෙන් සම්බන්ධ වන අවස්ථාවන්හි නාම වාක්‍යාංශ ඛණ්ඩයන්ට පෙර ක්‍රියාව රහිත ක්‍රියා වාක්‍යාංශය යෙදේ.

ක්‍රි ර. ක්‍රි වා. + නා. වා. ඛ. + නා. වා. ඛ. + ප්‍ර. නා.

නිද : "ශගශ /බමණ මෙගලි පුත/ පරුමක මඣිම පුත දතහ/ලෙණෙ
(I.C. Vol. i, 1970: 81)

(iv.) නාම වාක්‍යාංශ අතර ක්‍රියා රහිත ක්‍රියා වාක්‍යාංශය යෙදුණු අවස්ථා පිළිබඳ සාධක පවති. එබඳු වාක්‍යයක ආකෘතික ලක්ෂණ මෙසේ ය.

නා. වි. + ප්‍ර. නා. + අප්‍ර. නා ථ. නා. වා.

නිද : "ගමණි අබයශ ඣයය අබි කණිය ලෙණෙ/ශගශ/මහප(දසනෙ)'
(I.C. Vol. i, 1970: 2)

(v.) නාම වාක්‍යාංශ එකක් හෝ කිහිපයක් ක්‍රියා වාක්‍යාංශය හා අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධ වන අවස්ථාවන්හි ක්‍රියා රහිත ක්‍රියා වාක්‍යාංශය නාම වාක්‍යාංශයන්ට පසුව යෙදේ.

නා. වා. + නා. වා + නා. වා. ර ක්‍රි. ර. ක්‍රි. වා.

නිද : "උපසික රුගය ලෙණෙ, උපසික තිසය ලෙණෙ උපසික සිවය මව තන/ අගත අනගත චතුදිශ සඝස" (I.C. Vol. i, 1970: 90)

(vi.) සම්පූර්ණ නාම වාක්‍යාංශය සහිත, ක්‍රියා වචනය රහිත ඇතැම් ක්‍රියා වාක්‍යාංශයක ක්‍රියාව ගිලිහී යයි. එවැනි ක්‍රියා වාක්‍යාංශයකට පසුව සංඛ්‍යාත්මක නාම වචනයක් යෙදෙයි. එය නාම වාක්‍යංශයේ නාමය හා අනුබද්ධ වේ.

නා. වා. + ක්‍රි ර. ක්‍රි වා. + සංඛ්‍යා නාමය

නිද : "ගමික නගහ ලෙණෙ ශගශ/ දුපටකෙ " (I.C. Vol. i., 1970: 12)

## නාම වාක්‍යාංශය පමණක් සහිත වාක්‍යයන්හි ආකෘතික ස්වරූප

ක්‍රි.පූ. 3 වන සියවසේ සිට ක්‍රි. ව. 7 වන සියවස තෙක් නාම වාක්‍යාංශය පමණක් සහිත වාක්‍යයන් ද බහුල ය. එම වාක්‍යයන්හි ලක්ෂණ අනුව ක්‍රියා පද සහිත වාක්‍යයන්හි නාම වාක්‍යාංශයට සමාන ය. මෙම වාක්‍ය විශේෂයෙහි ක්‍රියා වාක්‍යාංශය නොමැත්තේ ය. එහෙත්, ක්‍රියා වාක්‍යාංශය නොයෙදුණ ද එය එම වාක්‍යයෙහි අර්ථය අවබෝධ කර ගැනීමෙහිලා බාධාවක් නොවේ.

(i.) නාම වාක්‍යාංශය පමණක් සහිත වාක්‍යයන්හි මූලික ම වාක්‍ය ආකෘතිය මෙසේ ය.

නා. වි. + ප්‍ර. නා.

නිද : " බුතදතහ / ලෙණෙ " (I.C. Vol. i., 1970: 10)

(ii.) නාම වාක්‍යාංශය පමණක් සහිත වාක්‍යයේ ප්‍රධාන නාමයට පෙරටුව නාම විශේෂණ හෝ නාම විශේෂණ වාක්‍ය ඛණ්ඩ එකක් හෝ කිහිපයක් භාවිත වීම දැකිය හැකි ය. මෙම ලක්ෂණ සහිත ආකෘති පෙර සඳහන් කළ නාම වාක්‍යාංශ සහිත වාක්‍යයන්හි ආකෘතීන් හා අත්‍යන්තයෙන් ම සමාන ය.

නිද : "ශොණුතර කුලහ මරුමකනෙ/ ගුමතහ පුතෙ/ සොණුතරහ/ලෙණෙ "(I.C. Vol. i., 1970: 6)

මෙම වාක්‍යන්හි ආකෘතිය පහත පරිදි වේ.

නා. වි. වා. ඛ. + නා. වි. වා. ඛ. + නා. වි. + ප්‍ර. නා.

(iii.) නාම වාක්‍යාංශය පමණක් සහිත වාක්‍යයන්හි ප්‍රධාන නාමයෙන් පර ව ද නාම විශේෂණය භාවිත වේ. එවැනි වාක්‍යයන්හි සාමාන්‍ය ආකෘතිය පහත පරිදි වේ.

නා. වි. + ප්‍ර. නා. + නා. වි.

නිද : "අචරිය නද තෙරශ/ ලෙණෙ / මහපදසනෙ "(I.C. Vol. i., 1970: 18)

(iv.) ඇතැම් අවස්ථාවන්හි නාම වාක්‍යාංශයට අයත් ප්‍රධාන නාමය සඳහන් නොවේ. එයට විශේෂණ වශයෙන් යෙදෙන නාම විශේෂණ හෝ නාම විශේෂණ වාක්‍ය ඛණ්ඩයන් එකක් හෝ කිහිපයක් වාක්‍ය ලෙස යෙදී ඇත.

නිද : "ශෙනපති පුත/ පරුමක නදික පුත/ පමතිසහ පරුමක තුච හ උපශකී / උපශක අනුඩිය / උපසක බුති ශුමනහ "
(I.C. Vol. i., 1970: 26)

මෙම වාක්‍යයෙහි නාම වාක්‍ය ඛණ්ඩ දෙකක් ද නාම විශේෂණ කිහිපයක් ද යෙදී ඇත.. එහෙත්, මෙහි නාම වාක්‍යාංශයට අයත් ප්‍රධාන නාමය සඳහන් නොවේ. මෙවැනි වාක්‍යයන්හි සමස්තාර්ථය නිශ්චිත ව දැක්විය නොහැකි අතර, අරුත් සැපයිය හැක්කේ අනුමාන වශයෙනි.

(v.) මෙම අවධියේ නාම වාක්‍යාංශ සහිත වාක්‍යයන්හි අවසානයෙහි යෙදෙන නාමයට 'අ, ඉ, නි, එ' වැනි නිපාත එක් කර ක්‍රියාර්ථ ජනනයට යත්න දරා ඇත.

නිද : "බදත මිතෙන මපිත නගපවත ශෙනශනෙ"(එ) (I.C. Vol. i., 1970: 40)
"දමගුත තෙරහ ලෙණෙ පිපිලිගුහ"(අ) (I.C. Vol. i., 1970: 40)
"මහරඣශ අයක පරුමක පුශදෙවහ පොකරණි"
(I.C. Vol. i., 1970: 5)
"ගපති ශොදය පුත ශුමන මලුහ චොඩි" (I.C. Vol. i., 1970: 16)

(vi.) නාම වාක්‍යාංශය පමණක් සහිත වාක්‍යයන්හි ප්‍රධාන නාමය හා එක්වන නාම විශේෂණ කිහිපයක් යෙදෙන අවස්ථාවන්හි 'ච' නිපාතයෙන් සම්බන්ධ වේ. එවැනි වාක්‍යයන්හි ආකෘතිය දළ වශයෙන් පහත පරිදි වේ.

නා. වි. + නි නා. වි. + නි + ප්‍ර. නා.

නිද : "පරුමක ශිවහ/ ච/ බත අයිරහ/ ච/ ලෙණෙ" (I.C. Vol. i., 1970: 86)

## නිගමනය

ආරම්භක අවධියේ ඉතා සරල, අසංකීර්ණ ස්වරූපයක් ගත් ශිලාලේඛනාගත වාක්‍ය කාලාතික්‍රමයෙන් ඇති වූ භාෂාභිවෘද්ධියටත්, කාලීන අවශ්‍යතාවන්ටත් අනුව සංකීර්ණ ස්වරූපයට පත් වන ආකාරයත්, විවිධ ආකෘති සහිත වාක්‍ය නිර්මාණය වූ ආකාරයත්, වාක්‍යාකෘතීන්හි ක්‍රමික සංවර්ධනයත් පැහැදිලි කරගත හැකි විය.

## සංකේත නිරූපණය

| | |
|---|---|
| ප්‍ර. නා. | - ප්‍රධාන නාමය |
| අප්‍ර. නා. | - අප්‍රධාන නාමය |
| නා. වි. | - නාම විශේෂණ |
| නා. වි. වා. ඛ. | - නාම විශේෂණ වාක්‍ය ඛණ්ඩය |
| ක්‍රි | - ක්‍රියාව |
| ක්‍රි ර. ක්‍රි වා. | - ක්‍රියාව රහිත ක්‍රියා වාක්‍යාංශ |
| නි | - නිපාත/ පද, වාක්‍ය කණ්ඩ වෙන්කොට දැක්වීම සඳහා යෙදේ. |

## පරිශීලිත මූලාශ්‍රයෝ

Epigraphic Zeylanica (1912) (ED) De Z. Wickramssinha, D.M., London, Oxford University press, v. i.

Epigraphic Zeylanica (1933) (ED) De Z. Wickramssinha, D.M., London, Oxford University press, v. ii.

Epigraphic Zeylanica ( 1943) (ED) De Z. Wickramssinha, D.M., London, Oxford University press, v. iii.

Epigraphic Zeylanica (1943) (ED) Paranavitana, Senarat, London, Oxford University Press, v. iv.

Epigraphic Zeylanica (1955) (ED) Paranavitana, Senarat and Godakumbura, C.E, Colombo, The Government press , v. v,(1).

Fernando, P.E.E. (1949) Plaeographical Development of the Brahmi Script in Ceylon from 3rd B.C. to 7th Century A.D.' University of Ceylon Review, (ED) De Wijesekera, H., Mendis, G.C., Colombo, The Colombo Apothecaries' Co. Ltd, v. vii (3).

Geiger, W. (1938) A Grammar of the Sinhala Language, Colombo, The Royal Asiatic Society ( Ceylon Branch ).

Inscriptions of Ceylon (1970) (ED) Pranavitana, Senarat, Colombo, Government press Ceylon, v. i.

Inscriptions of Ceylon (1983) (ED) Pranavitana, Senarat, Colombo, Government press Ceylon, v. ii.

Muller, E. (1883) Ancient inscriptions in Ceylon, London, Tubner and Company.

Nicholas, C.W. (1949) Plaeographical Development of the Brahmi Script in Ceylon from 3rd B.C. to 7th A.C. University of Ceylon Review, (ED) De Wijesekera , H. , Mendis, G.C., Colombo, The Colombo Apothecaries' Co. Ltd, v. vii (1).

Sigiri Graffiti (1956) (ED) Paranavitana, Senarat, London,oxford University press, v. i.